**සීමාසහිත සීනෝර් පදනම - 2017**

**-------------------------------------**

සීමාසහිත සීනෝර් පදනමේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාර මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළයුතුයැයි අදහස් කරන සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම

**--------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**--------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට ආදාළ වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස පදනමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් පදනමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශකිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) 2008 පෙබරවාරි 14 දින සීමාසහිත සීනෝර් පදනම බංගලාදේශයේ ආයෝජකයකු සමඟ එළඹී ගිවිසුමකට අනුව ආරම්භකර තිබුණු ශ්‍රී බංගලාස් බෝට්ටු ව්‍යාපාරය ලාභ නොලබන තත්ත්වයේ පැවති බැවින් 2016 ජූලි 23 දිනැති අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය මත ගිවිසුම අවසන් කර තිබුණි. එහෙත් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 36 අනුව 2017 දෙසැම්බර් 31 දිනට පැවති රු.1,961,850 ක් වූ ආයෝජනයට අදාළව හානිකරණය (Impairment of investment) සඳහා වෙන්කිරීම් සිදුකර නොතිබුණි.

(ආ) පදනම 2015 වර්ෂයේ දී ගැණුම්කරුගේ ඉල්ලීම මත නිෂ්පාදනය කර තිබූ රු.4,822,544 ක් වටිනා ගිලන්රථ බෝට්ටුව 2016 වර්ෂය වන විට ද අදාල ගැණුම්කරු වෙත පවරා දී නොතිබියදී 2015 දෙසැම්බර් 07 දින විකුණුම් ආදායමක් ලෙස ගිණුම්ගත කිරීම නිවැරදි කිරීමට අදාළව පෙර වර්ෂයේ ලාභයට ගැලපීම් කරනු වෙනුවට සමාලෝචිත වර්ෂයේ විකුණුම් ආදායමට ගලපා තිබුණි. ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ලාභය රු.4,822,544 ක් අඩුවෙන් දක්වා තිබුණි. තවද, බෝට්ටුවේ පිරිවැය තොගයෙන් ඉවත් කිරීමට කටයුතු කර නොතිබීම හේතුවෙන්, සමාලෝචිත වර්ෂය අවසාන තොග ශේෂයේ නිරවද්‍යතාව පිළිබඳව විගණනයේ දී සෑහීමකට පත්විය නොහැකි විය. එසේම අදාළ බෝට්ටුව අබලි වශයෙන් විකිණීමට 2017 ජුනි 23 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී තීරණය කර තිබුණු නමුත් ඇති විය හැකි තොග අලාභ සඳහා ප්‍රමාණවත් වෙන් කිරීම් සිදු කිරීමට ද පදනම කටයුතු කර නොතිබුණි.

(ඇ) 2017 නොවැම්බර් 06 දින රු.8,741,820 ක් වටිනා පාලම් පාරුවක් නිෂ්පාදනය කර සැපයීමටත් සියයට 20 ක් වූ අත්තිකාරමක් ගෙවීමටත් පුද්ගලික ආයතනයක් සමඟ පදනම ගිවිසුම් ගතවී තිබුණි. 2019 මාර්තු 31 දින වන විටත් රු.මිලියන 2.5 ක් වැය කර නොනිමි තත්ත්වයේ පැවති පාලම්පාරුව ගැණුම්කරු වෙත පවරා දී නොතිබියදී 2017 ඔක්තෝබර් 31 දින රු.8,741,820 ක් විකුණුම් ආදායමක් ලෙස සලකා ගිණුම්ගත කර තිබුණි. මේ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අයභාරය මෙන්ම 2017 දෙසැම්බර් 31 දිනට ණයගැති ශේෂය රු.8,741,820 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඈ) 2017 වර්ෂයට අදාලව රු.1,241,176 ක ආදායමක් උපයා තිබුණු ජංගම වැඩපොළවල්හි (Mobile Workshop) වටිනාකම දේපල ලෙස හඳුනාගෙන පදනමේ මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් කර නොතිබුණි.

(ඉ) 2004, 2011, හා 2015 යන වර්ෂවලට අදාළව අයනොවී පවතින 2017 දෙසැම්බර් 31 දිනට එකතුව රු.57,261,894 ක් වූ ණයගැතියන් සඳහා ප්‍රමාණවත් අඩමාණ ණය වෙන්කිරීමක් සිදුනොකර රු.6,392,490 ක වෙන්කිරීම් පමණක් සිදුකර තිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඊ) මත්තුමගල ඉඩමෙහි අයිතිය හා පිරිවැය විශ්වාසදායක ලෙස තහවුරු කිරීමට අදාල වූ ඔප්පු හෝ තක්සේරු වාර්තා විගණනයට ඉදිරිපත් නොවීය.

(උ) ජාතිය ගොඩනැගීමේ බදු වාර්තා හා මූල්‍ය ප්‍රකාශනවලට අනුව 2017 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ජාතිය ගොඩනැගීමේ බදු රු.9,630,913 කින් වැඩියෙන් පෙන්නුම් කර තිබුණු අතර පෙර වර්ෂවල සිට මූල්‍ය ප්‍රකාශනවල පැවතගෙන එන රු.7,429,048ක් වූ සෘණ ගෙවිය යුතු එකතු කළ අගය මත බදු ශේෂය කිනම් වර්ෂයකට අදාළ දැයි පැහැදිළි කිරීමට පදනම සතුව තොරතුරු නොවීය.

(ඌ) 2010 වර්ෂයේ දී ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය විසින් මට්ටක්කුලිය බෝට්ටු අංගනයට බෝට්ටු අච්චුවක් නිර්මාණය කිරීම සඳහා ලබාදී තිබූ රු.මිලියන 20 ක රාජ්‍ය ප්‍රදානවලින්

ඉතිරි වී තිබූ රු.2,078,392 ක් ශේෂය අමාත්‍යාංශයට පියවිය යුතු ශේෂයක් ලෙස 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල ද දක්වා තිබුණ ද ඊට අදාල මූලාශ්‍ර ලියවිලි ආයතනය සතු නොවීය.

(එ) පදනමේ මූල්‍ය ප්‍රකාශනවල 2017 දෙසැම්බර් 31 දිනට ධීවර අමාත්‍යාංශය, ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය හා ජාතික ජලජීවි වගා සංවර්ධන අධිකාරිය නමින් රු.11,333,779 ක ණයගැති ශේෂ දක්වා තිබුණද එම ආයතනවල මූල්‍ය ප්‍රකාශනවලට අනුව එම ශේෂ නොමැති බව සනාථ වීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.11,333,779 ක ණයගැති ශේෂයේ නිරවද්‍යතාවය සම්බන්ධයෙන් විගණනයේදී සෑහීමට පත්විය නොහැක.

(ඒ) 2017 දෙසැම්බර් 31 දිනට පැවති වෙළඳ ණයහිමියන් තුළ ඇතුළත් එකතුව රු. 1,385,429 ක ණයහිමියන් සම්බන්ධයෙන් තොරතුරු සමාගම සතුව නොතිබුණු හෙයින් හා එකතුව රු.32,684,900 ක් වූ තෝරාගත් ණයහිමියන් 35කට අදාළව ශේෂ සනාථන විගණනයට ලැබී නොතිබීම හේතුවෙන් එකතුව රු. 34,070,329 ක ණයහිමි ශේෂයේ නිරවද්‍යතාවය සම්බන්ධයෙන් විගණනයේදී සෑහීමට පත්විය නොහැක.

(ඔ) 2017 දෙසැම්බර් 31 දිනට පැවති රු.538,130 ක ණයහිමි ශේෂය අදාළ ආයතනය විසින් ශූන්‍ය ශේෂයක් ලෙස සනාථ කර තිබූ බැවින් එම ශේෂයේ නිරවද්‍යතාවය සම්බන්ධයෙන් විගණනයේදී සෑහීමට පත්විය නොහැක.

(ඕ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල වෙනත් ලැබිය යුතු දෑ යටතේ දිගු කාලයක් පැවති රු.1,892,572 ක් සම්බන්ධයෙන් විමර්ශන වාර්තා හා කුලී ගිවිසුම් ඉදිරිපත් කිරීමට පදනම අපොහොසත් විය.

(ක) 2011 වර්ෂයේ පුද්ගලික ආයතනයක් වෙත අනු කොන්ත්‍රාත් පදනම මත මාළු දැල් නිපදවීම සඳහා ලබාදුන් රු.5,059,050 ක් වටිනා අමුද්‍රව්‍යවලින් රු.149,275 ක් වටිනා නිෂ්පාදිත දැල් පමණක් පදනම වෙත ලැබීම හේතුවෙන් ඉතිරි රු.4,909,775 ක හෙවත් සියයට 97 ක අමුද්‍රව්‍ය වටිනාකම 2011 වර්ෂයේ සිට නිරවුල් කිරීමට කටයුතු කිරීමකින් තොරව මූල්‍ය ප්‍රකාශනවල ලැබිය යුතු දෑ යටතේ පෙන්නුම් කළ ද මේ සම්බන්ධයෙන් එළඹී කොන්ත්‍රාත් ගිවිසුම ඉදිරිපත් කිරීමට පදනම අපොහොසත් විය.

(ග) පදනම විසින් විගණනයට ඉදිරිපත් කරන ලද ක්ෂය ගණනය කිරීම් උපලේඛන අනුව 2017 දෙසැම්බර් 31 දිනට සමුච්චිත ක්ෂය වෙන්කිරීම් ශේෂය හා මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන සමුච්චිත ක්ෂය වෙන්කිරීම් ශේෂය අතර රු.4,848,844 ක වෙනසක් පැවතුණි.

(ජ) 2017 දෙසැම්බර් 31 දිනට සීනෝර් පදනමේ මූල්‍ය ප්‍රකාශනවල නෝර්ත් සී සමාගම නමින් ජංගම වත්කම් හා වෙළඳ ණයහිමියෝ යටතේ පිළිවෙලින් රු. 26,294,662 ක් හා රු.18,010,833 ක් දක්වා තිබුණද නෝර්ත් සී සමාගමේ මූල්‍ය ප්‍රකාශන අනුව වෙළඳ ණයහිමියෝ යටතේ පමණක් රු.2,101,138 ක් වූයෙන් පදනමේ මූල්‍ය ප්‍රකාශනවල ජංගම වත්කම් හා වෙළඳ ණයහිමියෝ යටතේ දක්වා තිබූ රු.26,294,662 ක් හා රු.15,909,695 ක් වූ ශේෂයන්ගේ නිරවද්‍යතාවය සම්බන්ධයෙන් විගණනයේදී සෑහීමට පත්විය නොහැක.

## 2. තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම ඡේදයෙහි දක්වා ඇති කරුණුවලින්වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට සීමාසහිත සීනෝර් පදනමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.1 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2007 අංක 07 දරන සමාගම් පනතේ 163 (2) වගන්තිය ප්‍රකාරව මා විසින් පහත සඳහන් කරුණු දක්වමි.

(අ) මතය සඳහා පදනම හා විගණනයේ විෂය පථය හා සීමාකිරීම් ඉහත දක්වා ඇති පරිදි වේ.

(ආ) තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම ඡේදයේ දක්වා ඇති කරුණුවලට යටත්ව විගණනය සඳහා අවශ්‍ය සියළුම තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද බවත්, මාගේ පරීක්ෂණවලින් පෙනියන අන්දමට සමාගම විසින් විධිමත් ගිණුම්කරණ වාර්තා පවත්වා ඇති බවත්,

සමාගමේ මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියෙහි අවශ්‍යතාවයන්ට අනුකූල වන බවත් මා දරන්නා වූ මතය වේ.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා පදනමේ මූල්‍ය ප්‍රතිඵලය බදුවලට පෙර රු.15,712,413 ක ශුද්ධ ලාභයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ බදුවලට පෙර ශුද්ධ ලාභය රු. 9,566,818 ක් වූයෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු. 6,145,595 ක වර්ධනයක් විය. සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ලාභය ක්‍රමයෙන් වැඩිවී පැවතුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කාර්යසාධනය

### 4.1.1 සැලසුම් කිරීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ) සංයුක්ත සැලැස්ම**

2003 ජුනි 02 දිනැති අංක පීඊඞී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1 ඡේදයට අනුව 2017 වර්ෂයෙන් ආරම්භ වන ඉදිරි වර්ෂ 03 කට අදාල සංයුක්ත සැලැස්ම 2018 ඔක්තෝබර් 29 දිනවන විටත් සකස් කර නොතිබුණි.

**(ආ) ක්‍රියාකාරි සැලැස්ම**

2017 වර්ෂය සඳහා වූ ක්‍රියාකාරි සැලැස්ම, පදනමේ ව්‍යාවස්ථාවලියේ සඳහන් අරමුණු ආවරණය වන පරිදි පිළියෙල කර නොතිබුණු අතර ප්‍රධාන කාර්යයන් 03 ක් පමණක් සැලකිල්ලට ගෙන ක්‍රියාකාරි සැලැස්ම පිළියෙල කර තිබුණි.

**(ඇ) අයවැය පාලනය**

2003 ජුනි 02 දිනැති අංක පීඊඞී/12 රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2.4 හා 5.2.1 ඡේදවල විධිවිධානයන්ට පටහැනිව 2017 වර්ෂය සඳහා වූ අයවැය ලේඛනය 2016 දෙසැම්බර් 27 දින අනුමත කර තිබුණු අතර එම අයවැය ලේඛනයට අයවැයගත මූල්‍ය තත්ත්ව ප්‍රකාශයත්, ක්‍රියාකාරි සැලැස්මට අනුගතවන පරිදි වූ අයවැය ගත මූලධන වියදම් ප්‍රකාශයත් ඇතුළත් කර නොතිබුණි.

### 4.1.2 ක්‍රියාකාරිත්වය හා සමාලෝචනය

පදනම විසින් ඉටුකළ යුතු කාර්යභාරයන් සම්බන්ධයෙන් ඒවායේ නිමැවුම් මට්ටම මැනීම හා ප්‍රතිඵලය ඇගයීම සඳහා අවශ්‍ය කාර්යසාධන දර්ශක සකසා නොතිබුණු බැවින්, ඉටුකර තිබුණු කාර්ය භාරයන්හි නිමැවුම් මට්ටම හා ප්‍රතිඵලයන් ඇගයීම සිදුකළ නොහැකි විය.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

**(අ) පදනමට අයත් දැල් නිෂ්පාදන කම්හල් රාජ්‍ය සමාගමක් වෙත පැවරීම හා රාජ්‍ය සමාගම වෙත පැවති බෝට්ටු අංගනයක් පදනමට පැවරීම**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ශ්‍රී ලංකාව තුළ නයිලොන් මාළු දැල් නිෂ්පාදනය සම්බන්ධයෙන් ජාත්‍යන්තර ප්‍රමිත සහතික (ISO 9001 - 2000) හිමි එකම ආයතනය වූ සීමා සහිත සී-නෝර් සමාගම සතු දැල් කම්හල් දෙක 2011 ජුනි 22 දින නෝර්ත් සී සමාගම වෙත පවරා තිබුණු අතර එමගින් ධීවර ක්ෂේත්‍රයට හා ආයතනයට අහිතකර බලපෑමක් ඇතිවිය හැකි බව නිරීක්ෂණය විය.

(ii) නෝර්ත් සී සමාගම සතුව තිබූ යුද්ධයෙන් විනාශ වී තිබුණු කරෙයිනගර් බෝට්ටු අංගනය ධීවර අමාත්‍යාංශය යටතේ වූ සීනෝර් ආයතනය වෙත 2014 වර්ෂයේ පවරා දී ඇතත් 2017 අවසන් වනතුරුත් එහි නිෂ්පාදන කටයුතු සිදුකර නොතිබුණි.

**(ආ) සී-නොර් පදනම සතු ඉඩමක් බදුදීම**

---

සී-නෝර් පදනම සතු ඩී.ආර්. විජේවර්ධන මාවතේ පිහිටි රූඩ් 02 පර්චස් 18.24 ක ඉඩම් ප්‍රමාණය පෞද්ගලික ආයතනයකට ආපනශාලාවක් පවත්වාගෙන යාම සඳහා 1998 ජූලි 04 දින සිට වර්ෂ 20 ක කාලයකට බදු දී තිබුණු අතර 2018 ජූලි 04 දින එම ගිවිසුම් කාලය අවසන් වී තිබුණි. 2018 මාර්තු 21 දිනැති අංක අමප 18/0384/725/014 දරන අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි තක්සේරු දෙපාර්තමේන්තුව විසින් 2016 සැප්තැම්බර් 20 දින ලබාදෙන ලද තක්සේරු වටිනාකම වූ රු.39,300,000 ක වාර්ෂික බදුකුලිය මත නැවත එම ආයතනය වෙත බදු දීමට තීරණය කර තිබුණද, 2018 මාර්තු 05 දින ජනාධිපතිතුමාගේ නිරීක්ෂණයකට අනුව "වෙනත් ආයෝජකයන්ගේ අභිලාෂය ප්‍රකාශ කිරීමට අවස්ථාවක් ලබාදීම සුදුසු බව" දන්වා තිබුණි. එසේ තිබිය දී ඔරියන්ට් පර්ල් රෙස්ටුරන්ට් ආයතනය නඩුවක් ගොනු කර ඇති බව නිරීක්ෂණය විය. මේ නිසා නැවත ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමට පදනමට නොහැකි වී තිබුණි.

**4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

---

**(අ) වාහන පාලනය**

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) පදනම සතු වාහනයක් 2017 මාර්තු 21 දින හදිසි අනතුරකට ලක් වී රු.25,000 ක් වැයකර අලුත්වැඩියා කර තිබුණි. මේ සම්බන්ධ මු.රෙ. 103 හා 104 ප්‍රකාරව වාහනයට සිදු වූ හානිය සම්බන්ධයෙන් වගකිව යුත්තන් නිශ්චය කිරීම සඳහා පරීක්ෂණ ආරම්භ කර නොතිබුණි.

(ii) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය ප්‍රකාරව ඉන්ධන දහනය පිළිබඳ පරීක්ෂණ සිදු කර නොතිබුණි.

(iii) සී-නෝර් පදනම සතුව වාහන 11 ක් පැවති අතර 2017 අවසන් වනතුරු එම වාහන සඳහා ලොග් පොත් භාවිතා කර නොතිබුණි.

(iv) මෙම වාහන 11 න් 6 ක් අලුත් වැඩියා කළයුතු තත්ත්වයේ පැවති අතර වාහන 4 ක් වසර 20 ත් වසර 30 ත් අතර කාලයක සිට පවතින බව නිරීක්ෂණය විය. අලුත්වැඩියා හා නඩත්තු වියදම් සඳහා ලේඛන පවත්වා නොගැනීම හේතුවෙන් මෙම වාහන අලුත්වැඩියා කර පවත්වා ගැනීමේ යෝග්‍යතාවය පරීක්ෂා කිරීමට නොහැකි විය.

(v) 2010 මැයි 20 සිට 2014 දෙසැම්බර් 22 දක්වා සේවය කළ කළමණාකරුගේ ප්‍රයෝජනය සඳහා සී-නෝර් පදනමෙන් එම කාලපරිච්ඡේදය තුළ ලබාදී තිබූ රු.474,976 ක් වටිනා ලී බඩු හා වෙනත් භාණ්ඩ වලින් 2017 අගෝස්තු 18 දින රු.136,782 ක් වටිනා භාණ්ඩ නැවත භාරදී තිබූ නමුත් රු.141,350ක් වටිනා භාණ්ඩ අයිතම 12 ක් විගණිත දින වන 2018 ඔක්තෝබර් 10 දින වන විටත් භාර දී නොතිබුණි.

**(ආ) බහුදින ධීවර යාත්‍රා නිෂ්පාදනය කර සැපයීම**

---

2016 ජූලි 06 දිනැති අමප/16/1233/725/020-1 දරන අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි මත්ස්‍ය පසු අස්වනු හානිය අවම කර ගුණාත්මක භාවයෙන් යුතු මත්ස්‍ය නිෂ්පාදන, පාරිභෝගිකයන්ට ලබාදීමේ අරමුණින් බහුදින යාත්‍රා 10 ක් නිපදවා සැපයීමට සී-නෝර් පදනමට ලබා දී තිබුණි. බහුදින යාත්‍රාවක නිෂ්පාදන මිල රු. මිලියන 26 කට තක්සේරු කර රජයෙන් සියයට පනහක සහනාධාරයක් ද සියයට

පනහක් ධීවරයා විසින් ද දැරිය යුතු ව තිබුණි. මෙම කාර්යය 2016 දෙසැම්බර් 15 දිනට ප්‍රථම ක්‍රියාත්මක කිරීමට අවශ්‍යාව ඇති බැවින් බහුදින යාත්‍රාවලින් 5 ක් සී-නෝර් පදනම විසින් ද ඉතිරි යාත්‍රා 5 ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි පෞද්ගලික යාත්‍රාංගන දෙකක් මඟින් සී-නෝර් පදනමේ අධීක්ෂණය යටතේ නිෂ්පාදන කටයුතු සිදුකිරීම ආරම්භ කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) සී-නෝර් පදනම විසින් 2016 දෙසැම්බර් 15 දිනට පෙර බහුදින යාත්‍රා 5 ක නිෂ්පාදන කටයුතු අවසන් කළයුතු වුවත් සී-නෝර් පදනම බහුදින යාත්‍රා 2 ක නිෂ්පාදනය 2018 අගෝස්තු අවසන් වන විට ද අවසන් කිරීමට නොහැකි ව තිබුණි. තවද පෞද්ගලික ආයතනයකට ලබාදුන් බහුදින යාත්‍රා 3 ක් 2018 ඔක්තෝබර් 29 දින වන විටත් නිෂ්පාදනය කර නොතිබුණි.

(ii) සී-නෝර් පදනම නිපදවා ධීවරයෙකුට භාරදෙන ලද යාත්‍රාවක්, ප්‍රථම මුහුදු ගමනේදීම එනම් 2018 මාර්තු 22 දින ගිනිගෙන විනාශ වී තිබුණි. 2018 පෙබරවාරි 20 දින ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ නාවික ඉංජිනේරු සහකාර විසින් බහුදින යාත්‍රාව හොඳ තත්ත්වයෙන් නිපදවා ඇති බව සනාථ කර තිබුණ ද, මෙම හානිය සම්බන්ධ මු.රෙ.103 හා 104 ප්‍රකාරව විධිමත්ව පරීක්ෂාවක් සිදු කර නොතිබුණි.

**4.4 කාර්ය මණ්ඩල පරිපාලනය**

----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2017 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තත්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 3 | 1 | 2 |
| තෘතියික මට්ටම | 20 | 8 | 12 |
| ද්විතියික මට්ටම | 43 | 32 | 11 |
| ප්‍රාථමික මට්ටම | 69 | 47 | 22 |
| | **135** | **88** | **47** |

(ආ) අනුමත කාර්ය මණ්ඩලයට ඇතුළත් ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 2 ක් සහ තෘතියික මට්ටමේ පුරප්පාඩු 12 ක් සමඟ පුරප්පාඩු 47 ක් සඳහා බඳවා ගැනීම් සිදුකර නොතිබුණි. බහුදින ධීවර යාත්‍රා නිෂ්පාදනයේ ප්‍රමාදයටත්, මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීමේ ප්‍රමාදයටත් සේවක පුරප්පාඩු බලපා තිබුණි.

**5.** **තිරසර සංවර්ධන අරමුණු ලඟාකර ගැනීම**

-----------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාළව පදනම විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් පිළිබඳ දැනුවත් වී තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟා විය යුතු සන්ධිස්ථානයන් ද ඉලක්ක මත ළඟාවීම් මැන බැලීම සඳහා වන දර්ශකයන් ද හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) තිරසර සංවර්ධන ඉලක්ක ළඟා කර ගැනීමට සූදානම් වීමේ දී අනෙකුත් ආයතන සමඟ මනා සම්බන්ධීකරණයක් නොකිරීම හේතුවෙන් ඉලක්ක ගත අරමුණු කරා ළඟාවීමට සැලැසුම් සකස් කිරීමේ දී හා පෙර සූදානම් වීමේ ක්‍රියාවලිය ඉතා මන්දගාමී හෝ දුර්වල තත්ත්වයක පැවැති බව නිරීක්ෂණය විය.

**6.** **ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

---------------------------------------

**6.1** **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

-------------------------------

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/ 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1. වගන්තිය ප්‍රකාරව කෙටුම්පත් වාර්ෂික වාර්තාව හා මූල්‍ය ප්‍රකාශන මුදල් වර්ෂය අවසන් වී දින 60ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවද, සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන මාස 09 ක ප්‍රමාදයකින් පසු 2018 නොවැම්බර් 19 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

**6.2** **අභ්‍යන්තර විගණනය**

-------------------------

මු.රෙ. 134 (2) ප්‍රකාරව මුදල් කටයුතු පිළිබඳව ක්‍රමවත් වූ ද කාර්යක්ෂම වූ ද පරීක්ෂාවක් කිරීමට හැකිවනු පිණිස මුදල් කටයුතුවලට අදාළ අංශ සමීක්ෂණයට භාජනය කිරීම සඳහා 2017 වර්ෂය සඳහා වූ අභ්‍යන්තර විගණන වැඩසටහන අංශ 20 කට අදාළව පිළියෙල කර ඉදිරිපත් කර තිබුණ ද අංශ 7 කට අදාළව පමණක් අභ්‍යන්තර විගණනය සිදුකර තිබුණි.

**6.3** **ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය**

------------------------------------------

**6.3.1** **ප්‍රසම්පාදනයන්**

---------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2017 වර්ෂයේ ප්‍රසම්පාදනයන් වෙනුවෙන් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (ඇ) හා අත්පොතෙහි 4.2.1 ප්‍රකාරව විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. තවද 2017 වර්ෂයේ සිදු කළ එකතුව රු.55,584,916 ක් වූ අමුද්‍රව්‍ය ප්‍රසම්පාදන අවස්ථා 3 ක් සඳහා මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.2 , 4.3 , 2.11.1 (ඇ) , 2.8.4 සහ 8.9.1 (ආ) ඡේද ප්‍රකාරව පිළිවෙලින් ප්‍රසම්පාදන කාල සටහන් හා මුළු පිරිවැය ඇස්තමේන්තුවක් පිළියෙල කළ බවටත්, ප්‍රසම්පාදන කමිටුවේ හා තාක්ෂණික ඇගයීම් කමිටුවේ ඒකාබද්ධ පළමු රැස්වීමක් පැවැත්වූ බවටත්, තාක්ෂණික ඇගයීම් කමිටුව පත්කළ බවටත් සාක්ෂි නොවූ අතර සැපයුම්කරු සමඟ විධිමත් ලිඛිත ගිවිසුමකට එළඹී නොතිබුණි.

(ආ) 2016 ජුනි 17 දිනැති අංක 06 / 2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය අනුව පිරිවැය රු. මිලියන 10 ත් රු. මිලියන 15 ත් අතර වන ප්‍රසම්පාදන සඳහා නැවත නොගෙවන ටෙන්ඩර් ගාස්තුව රු. 3,500 ත් රු.12,500 ත් අතර විය යුතු වුවත් ඉහත අංක.2017/FGRM/01 සහ අංක.2017/FGRM/04 දරන ප්‍රසම්පාදනයන්හි දී නැවත නොගෙවන ටෙන්ඩර් ගාස්තුව ලෙස රු.1,500 ක් අයකර තිබුණි. ඒ අනුව රු.3500 ක් වන අවම ගාස්තුව අයනොකිරීම හේතුවෙන් ප්‍රසම්පාදන 8 කින් රු.16,000 ක් අහිමි වී තිබුණි.

(ඇ) තෝරාගත් සැපයුම්කරු විසින් සියයට 5 ක කාර්යසාධන බැඳුම්කරයක් ලබාදිය යුතු බවට ලංසු කැඳවීමේ ලේඛනවල පිරිවිතරයන්හි සඳහන්ව තිබුණත්, ඉහත ප්‍රසම්පාදනයන් තුනට අදාලව කාර්යසාධන බැඳුම්කර ලබාදුන් බවට සාක්ෂි ඉදිරිපත් නොකෙරුණි.

(ඇ) ප්‍රසම්පාදනයන් තුනකට අදාලව තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ලංසු කැඳවීමේ ලේඛනවල සඳහන් පිරිවිතරයන් ඉදිරිපත් කරන ලද ලංසු පිරිවිතරයන් සමඟ සංසන්දනය කළ බවට ලිඛිත සාක්ෂි නොතිබීම හේතුවෙන් තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශය පිළිබඳව සෑහීමකට පත්විය නොහැකි විය.

**6.4 නොවිසඳී ඇති විගණන ඡේද**

2016 වර්ෂයේ විගණන වාර්තාව මගින් පෙන්වාදෙන ලද පහත කරුණු සම්බන්ධයෙන් මෙම වාර්තාවේ දින දක්වා ආයතනයේ අවධානය යොමුවී නොතිබුණි.

| **ඡේද අංකය** | **නිරීක්ෂණය** |
|---|---|
| 2.2.5(ආ) | සී-නෝර් පදනම සතුව පැවති ලුණුවිල හා වීරවිල කර්මාන්තශාලා දෙක නෝර්ත් සී ලිමිටඩ් වෙත පැවරීම සම්බන්ධයෙන් 2010 නොවැම්බර් 02 දිනැති අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව, වත්කම්වල පැවරුම් වටිනාකම ගණනය කිරීමේ වාර්තාව හෝ රජයේ තක්සේරු වාර්තාව 2018 ඔක්තෝබර් 29 දින වන විටත් විගණනයට ඉදිරිපත් නොකෙරුණි. |
| 4.2 (අ) ii | මත්තුමගල වාහන අලුත්වැඩියා වැඩපොළ පිහිටි ඉඩමේ හිමිකාරත්වය තහවුරු කර ගැනීම සඳහා අවශ්‍ය හිමිකම් ඔප්පු හෝ වෙනත් සාක්ෂි කිසිවක් 2018 ඔක්තෝබර් 29 දින වන විටත් විගණනයට ඉදිරිපත් නොකෙරුණි. |
| 4.4 (අ) | 2007 පෙබරවාරි 22 දිනැති අංක අමප/07/0198/351/001 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව 2008 පෙබරවාරි 14 දින සීමා සහිත සී-නෝර් සමාගම විසින් බෝට්ටු නිෂ්පාදන බද්ධ ව්‍යාපාරයක් ආරම්භ කිරීම සඳහා බංගලාදේශයේ එලයිඩ් ඇග්‍රෝ ඉන්ඩස්ට්‍රිස් සමාගම සමග 2008 වර්ෂයේදී ගිවිසුමකට එළඹ තිබුණි. |

(i) ගිවිසුම අනුව ව්‍යාපාරයේ බද්ධ හවුල්කරු සම්බන්ධයෙන් බැංකු සුරක්ෂණයක් ලබාගෙන නොතිබුණු අතර වැඩිපුර එ.ජ.ඩො. 21,265 ක් ආයෝජනය කර තිබුණි.

(ii) ආයෝජනය වෙනුවෙන් 2017 වර්ෂය දක්වා කිසිදු ප්‍රතිලාභයක් සීනෝර් පදනමට ලැබී නොතිබුණු අතර 2016 ජුලි 28 දිනැති අංක 310 දරන අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව මගින් ව්‍යාපෘතිය අවසන් කිරීමට අනුමැතිය ලබාදී තිබුණි. එසේ වුවද 2018 ඔක්තෝබර් 29 දින වන විටත් ව්‍යාපෘතිය අවසන් කිරීමට කටයුතු කර නොතිබුණු අතර 2016 වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ රු.1,961,850 ක නාමික අගයක් ආයෝජන යටතේ දක්වා තිබුණි.

## 7. පද්ධති හා පාලනයන්

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා පදනමේ සභාපතිවරයාගේ අවධානයට වරින්වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

| පද්ධතිය | පද්ධතියේ දුර්වල මෙහෙයවීම |
| --- | --- |
| අ. ප්‍රසම්පාදනයන් | ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට පටහැනිව කටයුතු කිරීම. |
| ආ. වත්කම් බදු දීම | බදුකුළී ආදායම නිසි පරිදි අයකර ගැනීමට කටයුතු නොකිරීම. |
| ඇ. ක්‍රියාකාරි සැලැස්ම | ක්‍රියාකාරි සැලැස්මේ සඳහන් අරමුණු ඉටුකර ගැනීමට කටයුතු නොකිරීම. |